**ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 17 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑමමත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති අංක 1 හි බදු කුලී හා පළාත් පාලන ආයතන බදු වැය විෂයය යටතේ 2022 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණු රු.592,181ක වරිපනම් බදු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇත. | බිල්පත් ජනවාරි 31 දිනට පෙර ගෙවීම් සිදුකළ හොත් වට්ටම් ලබාගත හැකි නිසා මුදල් රෙගුලාසි 66 මගින් රු.1,119,500ක ප්‍රතිපාදන ලබාගෙන 2021 වර්ෂයේ සම්පූර්ණ බිල්පත් හා 2022 වර්ෂයේ බිල්පත්වලින් කොටසක් ගෙවීමට කටයුතු කර ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල වියදම් පමණක් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

#### (ආ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. දෙපාර්තමේන්තු පොත් අනුව (සිගාස් වැඩසටහන) දේපල, පිරියත හා උපකරණවල වටිනාකම රු.5,761,799,147 ක් වුවද, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම වටිනාකම රු.5,761,155,643 ක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.643,504 ක් අඩුවෙන් දක්වා තිබුණි. | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 දෙසැම්බර් මස උපකරණවලට එකතු කරන ලද අගයකි.මෙම අගය දෙවරක් උපකරණවලට එකතු වී ඇත්තේ සිගාස් පද්ධතියේ පැවති ක්‍රියාවලියේ හේතුවෙනි. | ගිණුම්කරණ පද්ධතියට නිවැරදිව දත්ත ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ii. 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඒ.සී.ඒ.06 ආකෘතිය සඳහා අමුණා දැක්විය යුතු නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව වෙනුවට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 82 ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂක ජනරාල්ගේ 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන චක්‍රලේඛ උපදෙස් පරිදි ඉදිරිපත් කර ඇති බව. | සිගාස් වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ----------- |
| ගිණුම් අංක 7002-0-0-310-0-21-0 දරන අග්‍රිම ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ලැබීම් හා ගෙවීම් රු.4,820,762,447ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව රු.4,903,492,447 ක් වූයෙන් රු.82,730,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය 2021 පෙබරවාරි මස භාණ්ඩාගාරය විසින් සිදුකළ ගණුදෙනුවක ප්‍රතිඵලයක් බව හා මේ හේතුවෙන් ගිණුම් කටයුතු වලට කිසිදු බලපෑම් සිදුනොවන දන්වමි.. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් නිවැරදිව සැසඳීම කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ----------- |
| (අ) වැය විෂයයන් 10 ක සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදනයට අදාලව වියදම් පැන නොනැගීම, කොවිඩ් වසංගතය හේතුවෙන් සැලකිය යුතු කාලසීමාවක් කාර්යාලය වසා තැබීම හා මන්දගාමීව කටයුතු සිදුකිරීම, අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වියදම් සමාලෝචනය මීට හේතු විය. | අවශ්‍යතාවය සලකා බලා කාර්යයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් සලසා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විෂයයන් 2 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොතිබුණු බැවින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදලින් සියයට 34 ක් සහ සියයට 1493 ක් මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණි. | ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිවීම. ග්‍රාම නිලධාරීන්ට හා තාක්ෂණික නිලධාරීන්ට සන්නිවේදන දීමනාවක් අනුමත විය. | අවශ්‍යතා සලකා බලා වැය විෂයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගත යුතුය. |
| (ඇ) වැය විෂයයන් 03ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබුණු රු.522,500,000 ක ප්‍රතිපාදන ඒසීඒ2(III) ආකෘතිය මගින් සංශෝධනය කිරීමට හේතුද සහිතව හෙලිදරව් කර නොතිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සපයා තිබූ වැය විෂයන් නොවන අතර, පරිපූරක ඇස්තමේන්තුව මගින් ලබාදුන් ප්‍රතිපාදන විය. | සංශෝධනය කිරීමට හේතුද සහිතව හෙලිදරව් කළයුතුය. |

## 2.3 බැරකම් බැඳීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවන ලෙස වැය විෂයයන් 02 ක ඉතිරිවීම් ඉක්මවා රු.77,715 ක බැරකම් වලට බැඳී තිබුණි. | සඳහන් කර ඇති බැරකම් අනිවාර්යයෙන්ම මාසිකව දැරිය යුතු වියදම් බවත්, 2021 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් හා අක්මුදල් නොමැති කමින් ඉදිරි වර්ෂයේ ගෙවිය යුතු වගකීමක් බව. | අවශ්‍යතා සලකා බලා වැය විෂයයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගත යුතුය. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.4,479,634,787 ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.153,621,768 ක් ඉතිරි වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඉතිරි වී ඇත. | ලබාදුන් සියළු ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළයුතුය. |

## 2.5 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 237 | සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිරෝධායනය වන පවුල් සඳහා භාණ්ඩ මලු 1764 ක් වෙනුවෙන් රු.17,595,000 ක් ගෙවීම් කිරීමේදී රජය වෙත භාණ්ඩ ලබාගත් බවට සහතික ලබා නොගෙන සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් සීමිත නිලධාරී පිරිසකගෙන් මෙම කටයුතු සිදුකළ බැවින් විධිමත් පරිදි කටයුතු කරගෙන යාමට නොහැකි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. මුදල් රෙගුලාසි 767(1) | 2013 වර්ෂයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණු ආධාර උපකරණ වර්ග 5ක ඒකක 191 ක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. | ආපදා තත්ත්වයන් මේ වන තෙක් ඇති නොවූ බව සහ මෙම භාණ්ඩ අවශ්‍ය වන වෙනත් ආයතනයකට ලබාදීමට කටයුතු කරන බව දන්වමි. | - එම - |
| (ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2013 ජූලි 05 දිනැති අංක HAF-3-ADMIN-02-002 දරන ලිපිය | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසම් 06 ක ග්‍රාම නිලධාරීන් සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් අනවසර අල්ලා ගැනීම්, ඉදිකිරීම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | රටේ පැවති කොරෝනා වසංගතය සහ රාජකාරි බහුලත්වය නිසා මෙම වාර්තා නියමිත පරිදි ලබාදීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 වංචනික ස්වරූපයේ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2020 නොවැම්බර් 02 දිනැති අංක PIF/03/2020(VI) හා 2020 නොවැම්බර් 30 දිනැති අංක PTF/03/2020(VII) සහ අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ 2021 මැයි 18 දිනැති අංක PTF/01/CIR-Progress/01 දරන චක්‍රලේඛ උපදෙස් වලට පටහැනි ලෙස නිරෝධායනයට ලක්කර නොතිබුණු පවුල් ඒකක 51ක් සඳහා රු.510,000 ක භාණ්ඩ බෙදාදුන් බවට තොරතුරු ඉදිරිපත් කර තිබුණි. තවද, මෙම භාණ්ඩ සැපයුම්කරුගෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරගත් බවට සහ ඉදිරිපත් කර තිබුණු විස්තරවල ඇතුළත් පවුල් ඒකක වලට එම භාණ්ඩ බෙදාදුන් බවට තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පවුල් 51 ක් සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් එවන ලේඛනවල විස්තර ඇතුළත් වී නොමැති බව දන්වමි. | චක්‍රලේඛන උපදෙස් වලට අනුකූල නොවන ලෙස වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනම් කර තිබුණු නිලධාරින් 04 දෙනෙකුගෙන්, සේවය අතහැර ගොස් තිබුණු නිලධාරීන් 03 දෙනෙකුගෙන් මියගොස් තිබුණු නිලධාරින් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතුව තිබුණු රු.719,018 ක් රු.314,515 ක් හා රු.178,298 ක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.177,772 ණය ශේෂය වාරික වශයෙන් අයකිරීමටත් ණය ශේෂ දෙකක වටිනාකම වූ රු.357,885 අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමටත් රු.138,371 ක ශේෂය ඇපකරුවන් දැනුවත් කොට අයකර ගැනීමටත් රු.126,325 ක මිය ගිය අයගේ ශේෂ, පාරිතෝෂිකයෙන් අයකර ගැනීමටත් කටයුතු කරමි. | රජයට අයවිය යුතු ණය ශේෂය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.8 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.13,978,130 ක් වූ වර්ෂ 02 ත් 04 ත් අතර වූ තැන්පතු 154 ක් සහ වටිනාකම රු.645,649 ක් වූ වර්ෂ 10 ට වැඩි තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පත් සියල්ල ආදායකයා වෙත ගෙවීමේ හැකියාව පැවතියද අක්මුදල් නොලැබීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකි බව දන්වමි. | නියමිත පරිදි අක් මුදල් ලබාගෙන ගෙවීමට කටයුතු කළයුතුය. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **කුට්ටිගල් ඇතුරු මාර්ග ඉදිකිරීම** | | |
| I. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක කුට්ටිගල් ඇතුරු මාර්ග 163 ක දාර කැපීම (Edge Cutting) නියමිත පරිදි සිදුකර නොතිබුණු අතර, ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.5,156,984 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීම්දී මිල විශ්ලේෂණ නිසි පරිදි සකස් නොකිරීම මෙම ඌණතාවයට හේතු වී ඇත.. | ඉටුකරන ලද වැඩ නියමිත පරිදි තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කල යුතුය. |
| II. අනුමත ඇස්තමේන්තුව අනුව, මාර්ගයේ පාදම මිලිමීටර 100 ක ඝනකමකින් යුක්තව ABC ඇතිරිය යුතු වුවද මිලිමීටර 90 ක ඝනත්වයට සිදුකර තිබුණි.ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක කොන්ත්‍රාත්කරුවන්ට නියමිත ප්‍රමිතියට සිදු නොකළ මාර්ග සඳහා සැලසුම් සකස්කර රු.4,112,657 ක් ගෙවා තිබුණි. | ABC හා ගල්කුඩු යන ස්ථර දෙකෙහිම එකතුව අවශ්‍ය ඝණකම් මට්ටමේ පවතින අතර එය මාර්ගයේ නියමිත ප්‍රමිතියට ගැටළුවක් නොවන බව දන්වමි. | ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| III. | මෙම ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක මාර්ග 05 ක් කිලෝමීටර් ලක්ෂය ව්‍යාපෘතිය යටතේ කාපට් ඇතිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම හේතුවෙන් රු.3,464,998 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. | 2016 වර්ෂයේ සංවර්ධනය කරන ලද මාර්ග අතුරෙන් විගණනය විසින් පරීක්ෂාවට ලක්කරන ලද මාර්ග 31න් 03ක් රථවාහන ප්‍රවාහනය සඳහා සුදුසු තත්ත්වයක තිබියදී වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් කාපට් කර ඇති බව දන්වමි. | කාපට් කර සුදුසු තත්වයේ තිබුණු මාර්ග නැවත සංවර්ධනයට නිර්දේශ කළ වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 ප්‍රසම්පාදනයන්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අඟුණුකොළපැලැස්ස නගරයේ ජල අපවහන කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තයේ මිල ගණන් කැඳවීමේදී ලංසුකරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීමට සති 03 ක කාලයක් ලබාදිය යුතු වුවද වැඩකරන දින 04 ක කාලයක් ලබාදී තිබුණි. තවද, ලංසු ලේඛන අනුව සුදුසු කොන්ත්‍රාත්කරුගේ අවම සුදුසුකම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සී 7 කාණ්ඩයේ ලියාපදිංචි විය යුතු වුවද එම සුදුසුකම සපුරා නොමැති ආයතන 02 කින් මිල ගණන් කැඳවා තිබුණි. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් කළයුතුව තිබුණු බැවින් මිලගණන් කැඳවීමේ ලිපිවලට අමතරව දූරකථනයෙන් දැනුම් දීමට කටයුතු කර ඇති බවත්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි පිළිබඳව තොරතුරු සඳහන් වී නොමැති ආයතනයයන්ගෙන් ලංසු කැඳවා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිලගණන් කැඳවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීම සහ සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිලගණන් ලබාගත යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ පැවති සුනාමි රීකන්ස්ට්‍රක්ෂන් ඒකකය මගින්ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු යතුරු පැදි දෙක 2017 වර්ෂයේ ජුනි මස 27 දින නැවත අධිකාරියට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුණද, භාර දී නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් අදාල යතුරු පැදි භාවිතයට නොගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගාල්කර තිබුණි. | යතුරු පැදි නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අදාල වත්කම් නියමිත ආයතනයට නොපමාව ලබාදීමට කටයුතු කළයුතුය. |

**3.4** පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1987 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුව තිබුණු සිද්ධි 22 කට අදාල රු.1,266,193 ක හානි හා පාඩු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හානි හා පාඩු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) හානි හා පාඩු ලේඛනයේ සටහන් කර තිබුණු රු.80,664 ක පාඩු හා අත්හැරීම් සිද්ධි 5 ක් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය සටහන - (1) යටතේ ඉදිරිපත් කර නොතිබුණි. | සිද්ධි 02 ක් සඳහා කපාහැරීමට අනුමැතිය ලැබී තිබුණද ලේඛනයෙන් ඉවත් කර නොමැති බවත්, තවත් සිද්ධ 02 ක් සඳහා ගොනු සොයාගත නොහැකි බැවින් ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වමි. | නිවැරදිව වාර්තා කළයුතුය. |

**3.5** අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර තිබුණු බෙල්ජියම නිවාස දෙවන පටුමග ඉතිරි කොටසේ කාණු පද්ධතිය සකස් කිරීමේ කර්මාන්තයේ ගිවිසුම් පත්‍රයේ මිල විචලන ගෙවීමට අදාල කොන්දේසි ඇතුළත් කර නොතිබුණු අතර, ඒ සඳහා විධිමත් පරිදි බලය ලබා නොගෙන මිල විචලන වශයෙන් රු.568,413ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | අංක අමප/21/2084/306/094 දරන 2021.12.06 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සංදේශයේ 3.2 යෝජනා පරිදි ගෙවීම් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයට දින 47 කට ප්‍රථම කර්මාන්තය නිමකර ඇති බැවින් සහ ගිවිසුම් කාලය මාස 03 ට අඩු බැවින් වැඩිපුර ගෙවූ මුදල් අයකරගත යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ 2021/1 මාර්ගෝපදේශ සංග්‍රහයේ 7(II) ඡේදයට අනුකූල නොවන පරිදි උම්බලකඩ පෝරණු සැකසීමේදී තාක්ෂණික නිර්නායක අනුගමනය කර නොතිබුණු ප්‍රතිලාභීන් 50 දෙනෙකුට රු.100,000 ක් බැගින් එකතුව රු.5,000,000ක් වටිනා ද්‍රව්‍ය ලබාදී තිබුණි. | සැලැස්මට අනුව පෝරනු සකස් කර ගැනීමට ප්‍රතිලාභීන් විරුද්ධ වූ අතර, ද්‍රව්‍ය ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව කටයුතු ඇත. | 2021/1 මාර්ගෝපදේශ සංග්‍රහයේ 7(II) ඡේදයට අනුකූල වන පරිදි කටයුතු කළයුතුය. |
| (ආ) | පිටස්තර පාර්ශවයන් විසින් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීමේ අවස්ථා 06 ක් සම්බන්ධයෙන් අධිකරණය විසින් නෙරපා හැරීමේ නියෝග නිකුත්කර තිබුණද, අදාල ඉඩම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රජයට පවරාගෙන නොතිබුණි. තවද, අධිකරණය විසින් නෙරපා හැරීමේ නියෝග නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර නැවත නඩු ගොනු කළයුතු බවට දන්වා තිබුණු අවස්ථා 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අනවසරයෙන් අල්ලා ගැනීම සම්බන්ධයෙන් 2022 ජනවාරි මස නිකුත් කළ ලිපි මගින් ග්‍රාම නිලධාරි වෙත දැනුම්දී යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | අධිකරණ නියෝග අනුව නොපමාව කටයුතු කළයුතුය. |
| (ඇ) | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් මිණිඇතිලිය ග්‍රාම නිලධාරී වසමේ අනවසර පදිංචිකරුවන් 5 දෙනෙකු සඳහා නිකුත් කර තිබුණු ඉවත්කිරීමේ නිවේදනය ("අ"ආකෘතිය) අනුව එම අනවසර පදිංචිකරුවන් ඉවත් වී නොතිබුණු අතර, ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නෙරපාහැරීමේ නියෝගය සඳහා ඉල්ලීම් ("ආ"ආකෘතිය) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකරණයට ඉදිරිපත්කර නොතිබුණි. | කොරෝනා තත්ත්වය හේතුවෙන් රජයේ ආයතන බොහොමයක රාජකාරි කටයුතු ක්‍රමවත්ව සිදුකර ගෙන යාමට නොහැකි වී ඇත. | අදාල නීති රෙගුලාසි අනුව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සූරියවැව මිරිජ්ජවිල මාර්ග ව්‍යාපෘතිය සඳහා 2013 අගෝස්තු 27 දින රජයට පවරාගෙන තිබුණු කැබලි අංක බී - 7377-ඒ කොටස සඳහා රු.1,887,000 ක ව්‍යවස්ථාපිත වටිනාකම ගෙවීමේ කාල පමාව හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පොළී ලෙස රු.1,102,197 ක අතිරේක මුදලක් ගෙවීමට නියමිතව තිබුණි. | ආයතන කිහිපයක ක්‍රියාවලියක සංකීර්ණ කටයුත්තක් බැවින් මෙවැනි ප්‍රමාදවීම් සිදුවන බව දන්වමි. | නිසි සම්බන්ධීකරණයකින් යුතුව අප්‍රමාදව ගෙවීම් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වාර්ෂික බදුකර 337කින් රු.719,154ක හිඟ වාර්ෂික බදු හා දඩ මුදල් අයකර නොතිබුණි. | හිඟ වාර්ෂික බදු හා දඩ මුදලින් රු.85,622ක් 2022.01.20 දිනවන විට අයකර ගෙන ඇති බවත්, වෙනත් අයෙකු භුක්තිවිඳින වාර්ෂික අවසරපත්‍ර අවලංගු කිරීමට කටයුතු කර ඇත. | හිඟ වාර්ෂික බදු හා දඩමුදල් අප්‍රමාදව අයකිරීමට කටයුතු කළයුතුය. |
| (ඊ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කළ අංක IML/A/HO/N/4314/LR/9 දරන කැණීම් බලපත්‍රය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) රජයේ ඉඩම් කාර්ය සංග්‍රහයේ II පරිච්ඡේදයේ 08 වන වගන්තිය, 1979 අංක 07 දරන (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ ඉඩම් නියෝග 180 වගන්තියට හා ජනාධිපති ලේකම්ගේ අංක SP/RD/02/10 දරන හා 2010 පෙබරවාරි 03 දිනැති රජයේ ඉඩම් කලමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 2.2 වගන්තියට අනුකූල නොවී කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබාදීමට සූරියවැව හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කටයුතු කර තිබුණි. | ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් මත රජයේ මිනින්දෝරු විසින් මෙම ඉඩම රජයේ ඉඩමක් බව තහවුරු කර ඇත. ඒ අනුව අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර අත්හිටුවන ලද අතර,ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021.03.22 දිනැති ලිපිය මගින් එම වාර්ෂික බලපත්‍රය ලබාදෙන ලෙස උපදෙස් ලබාදී තිබූ අතර,ආරම්භක වර්ෂයේ සිට බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණු බව. | චක්‍රලේඛය පරිදි කටයුතු කළයුතුය. |
| (ii) රජයේ ඉඩම් ආඥාපනතේ 196.1(vi)වගන්තිය ප්‍රකාරව හා ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුගේ අංක HT/ML/3485 දරන හා 2022 ජනවාරි 19 දිනැති තක්සේරු වාර්තාව ප්‍රකාරව 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මාස 120ක් සඳහා එකතුව | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය පරිදි 2011 වර්ෂයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් ලබාගත් තක්සේරු වාර්තාව අනුව බදු මුදල් අයකරගෙන ඇති බව. | ඉඩම් ආඥා පනත සහ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුගේ 2022 ජනවාරි 19 දිනැති අංක HT/KL/3485 දරන තක්සේරු වාර්තා ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.3,280,000ක්වූ වාර්ෂික බදු අදායම් අයකරගෙන නොතිබුණි. කෙසේ වුවද ඉඩමේ වාර්ෂික නොදියුණු වටිනාකම 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂයෙන් වර්ෂයට ලබාගැනීමට කටයුතු කළේ නම් අභිමිව වන වාර්ෂික බදුකුලී ආදායම තවදුරටත් වැඩිවන බව නිරීක්ෂණය විය. | | |
| (iii) | කැණීම් බලපත්‍රකරුගේ වාර්තා අනුව කැණීම් කරන ලද මුළු කළුගල් කියුබ් ප්‍රමාණය කියුබ් 173,586.2 ක් වූ අතර, කැලෑ ආඥා පනත ප්‍රකාරව බලපත්‍රකරුගෙන් අයකර ගත යුතු එකතුව රු.173,586,200 ක් වූ රජයේ ගාස්තු අයකරගෙන නොතිබුණි. කෙසේ වුවද, බලපත්‍රලාභියා විසින් කැණීම් කරන ලද මුළු කළුගල් කියුබ් ප්‍රමාණය කොපමණද යන්න හදුනාගැනීමට විශේෂඥ වාර්තාවක් ලබාගත යුතු බවත්, ඊට අනුකූලව තවදුරටත් අයකළ යුතු රජයේ ගාස්තු ප්‍රමාණය හදුනාගත යුතු බව නිරීක්ෂණය විය. | මෙම ඉඩම රජයේ ඉඩමක් ලෙස හදුනාගැනීමෙන් පසු අදාල තක්සේරුව අනුව නිවැරදිව කටයුතු කරගෙන යනු ලබන අතර, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය පරිදි 2011 වර්ෂයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් ලබාගත් තක්සේරු වාර්තාව අනුව මේ වන විට බදු මුදල් අයකරගෙන ඇති බව. | කැලෑ ආඥා පනත යටතේ නිකුත් කරන ලද අංක 1600/18 දරන 2009 මැයි 06 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 10(1) ඡේදය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (iv) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් නිකුත් කර තිබුණු කැණීම් බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුපුරණ ද්‍රව්‍ය අවසර බලපත්‍රයන් යටතේ 2011 වර්ෂයේ සිට මේ දක්වා විදුලි ඩෙටොනේටර් 27,100 ක් අවිධිමත්ව නිකුත් කර තිබුණි. | නිරීක්ෂණයට අදාල පිළිතුරක් ලබාදී නොමැත. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් නිකුත් කර තිබුණු කැණීම් බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කළයුතුය. |

**4. යහපාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිරෝධායනය කරන ලද පවුල් වලට රු.17,595,000ක භාණ්ඩ බෙදාදීමේදී අදාල භාණ්ඩ සුදුසුකම්ලත් ප්‍රතිලාභින් වෙත නිකුත් කිරීමට අදාල විස්තර ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. තවද අදාල භාණ්ඩ ප්‍රතිලාභින් වෙත භාරදුන් බවට හා භාරගත් බවට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | දුරකථනය මගින් අදාල ප්‍රතිලාභින්ට බඩු මලු ලැබුණු බව තහවුරු කරගෙන ඇති බව. | මිලදී ගන්නා භාණ්ඩ භාරගැනීමට හා බෙදාදීමට අදාලව විධිමත් වාර්තා පවත්වාගත යුතුය. |
| (ආ) අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ 2021 අගෝස්තු 24 දිනැති අංක PIF/03-2021(III) දරන චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල නොවන ලෙස සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අඩු ආදායම් ලාභීන් ලෙස තහවුරු කර නොගත් පවුල් සඳහා අඩු ආදායම්ලාභීන් වෙත බෙදාදිය යුතු රු.3,200,000 ක් වූ බඩු මලු 320 ක් බෙදා දී තිබුණි. | ප්‍රතිලාභීන් පිළිබඳව තොරතුරු ග්‍රාම නිලධාරී විසින් සහතික කර නොතිබූ බවත් පසුව එය නිවැරදි කර ඇත. | අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ 2021 අගෝස්තු 24 දිනැති අංක PIF/03-2021(III) දරන චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළයුතුය. |

**05. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට කාර්ය මණ්ඩලයෙහි 158 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණ අතර, අතිරික්ත නිලධාරීන් 107 දෙනෙකු විධිමත් පරිදි අනුමත කර ගැනීමකින් තොරව සේවයෙහි නියුක්ත කර තිබුණි. | පුරප්පාඩු අමාත්‍යාංශයට වාර්තා කර ඇති අතර, අතිරික්තතා ඇතිවීමට හේතුව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සංවර්ධන නිලධාරි බඳවාගෙන අනුයුක්ත කිරීම හේතුවිය. | පුරප්පාඩු කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත් අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය. |